134

පූර්ලේඛ

# ශ්‍රී මහා බෝධීන් වහන්සේ එහි ඉතිහාසය හා තදනුබද්ධ සංස්කෘතිය

වැලිවිටියාවේ සිරි ධම්මරක්ඛිත ස්ථවිර
(පණ්ඩිත, බී.ඒ.ගෞරව, ඇම්.ඒ. )

ප්‍රවේශ අංකය 134
වර්ග අංකය

ශ්‍රී ලංකා කැලණිය විශ්ව විද්‍යාලයේ
දර්ශන විශාරද ( Ph.D) උපාධිය
සඳහා ඉදිරිපත් කරන ලද නිබන්ධය

1991

# ග්‍රන්ථයේ අන්තර්ගතය

මෙම නිබන්ධයෙහි ප්‍රධාන පරිච්ඡේද පහක් ද, නිබන්ධකගේ නිගමන ද, උපග්‍රන්ථ තුනක් ද අන්තර්ගත ය. පළමුවන පරිච්ඡේදයේ බෝධිසංකල්පයත් වනස්පති වෘක්ෂ වන්දනාව හා එහි ඉතිහාසයත්, බෝධි ශබ්දයේ විරන්තන අර්ථ තත්ත්වත්, එහි ව්‍යවහාරාර්ථත්, හින්දු සංස්කෘතියේ වනස්පති වෘක්ෂපූජා හා බෞද්ධ බෝධිපූජා සංකල්පයේ අර්ථ විග්‍රහයත්, ශාරීරික පාරිභෝගික උද්දේශික ධාතු සංකල්පයත් ප්‍රමාණවත් පරිද්දෙන් අධ්‍යයනය කරන ලදි.

දෙවන පරිච්ඡේදය අපේ අධ්‍යයනයට මූලික වශයෙන් පාදක කර ගන්නා ලද මූලාශ්‍රය පිළිබඳ හැඳින්වීමකි. එම පාදක ග්‍රන්ථ හා බෝධි සාහිත්‍යයට ඇතුළත් සියලු ම කෘති පිළිබඳ විස්තර ප්‍රකට ව ඇති හෙයින් ඒවා හඳුන්වා ඇත්තේ ඉතා සංක්ෂිප්ත ව හඳුන්වා ඇත. තුන්වන පරිච්ඡේදය බෝධි ආගමනය පිළිබඳ ප්‍රකට ඉතිහාසය හා ඒ කරුණු ගැනමූලාශ්‍රයන්හි දැක්වෙන සමවිසමතා ද, බෝධියත් සමග මෙහි පැමිණි කුල ශ්‍රේණි ද, ඒ ඒ යුගවල දී බෝධිය රජය සමග සම්බන්ධ වූ අයුරු ද විමසන ලදි. බහුතරයක් වියතුන්ගේ විවිධ විචාරයන්ට ලක් වූ කුල ශ්‍රේණි පිළිබඳ ව විශේෂ අවධානයක් යොදමින් විචාරයක් කර ඇත. ලංකා සංස්කෘතියේ සෑම අංශයක් කෙරෙහි ම එම ශ්‍රේණිවලට අයත් වූවන්ගේ සහ සම්බන්ධතා හා බලපෑම් සියාරා ගිය හැටි එහි දී දැක ගැනීමට හැකි විය.

සිව්වන පරිච්ඡේදයේ දී විමර්ශනය කරන ලද්දේ බෝධින් වහන්සේ පිළිබඳ ව සමාජ සංස්ථාව තුළ ඇති වූ ආකල්ප, ප්‍රබෝධය, හා ඒ ඇසුරෙන් බිහි වූ බෝධිඝර ඇතුළු ගෘහනිර්මාණ හා කලාකෘතිද, වත්පිළිවෙත් හා ආර්ථික සාමාජික සබඳතා ගැනයි. බෞද්ධ බෝධි පූජාව හුදු වෘක්ෂ වන්දනාවක් නොවන හැටි ද එහි ලා ප්‍රකට කර ඇත.

පස්වන පරිච්ඡේදයෙහි ලා අෂ්ටඵලරුහ දෙතිස් ඵලරුහ බෝධීන්ගේ ව්‍යාප්තිය ඒ නිසා අනුරපුර මධ්‍යම රාජ්‍යයට ඇති වූ ප්‍රාදේශීය සබඳතා එය ධර්මප්‍රචාරක පිවී දෘශ්‍ය මාධ්‍යයක් වශයෙන් අපේක්ෂිත අර්ථයෙහි සාර්ථකත්වය පැහැදිලි කරන ලදි.

සවැනි පරිච්ඡේදය නිබන්ධකගේ නිගමන සඳහා වෙන වී ඇත. ඊ ළඟට ඇතුළත් කර ඇත්තේ උපග්‍රන්ථ තුනකි. එයින් 1 වැන්න බෝධියට යෙදෙන පර්යාය නම් පිළිබඳ විස්තරයක්. එක් වෘක්ෂයකට ඒ සා විශාල නම් රාශියක් ඇති වීමෙනුදු පෙනී යන්නේ එම වෘක්ෂයේ ව්‍යාප්තියයි. එම නම් එක්තරා වර්ගී කරණයක් යටතේ අර්ථ හා විස්තර ද සහිතව දක්වන ලදි. II වැන්න වෘක්ෂ වනස්පති පූජා පිළිබඳ අමතර විවරණයකි. III වැන්න බෝධීන් වහන්සේ උදෙසා පුරාතන නූතන පුදපූජා විධි ද, මෙකල දෛනික ව හා වාර්ෂික ව පැවැත්වෙන මංගල්‍ය ආදිය ගැන ද කරන ලද විමසීමකි. අවසානයට යොදා ඇති ලංකා සිතියමෙන් බෝධිය වැඩම්වා ගෙන ආ මාර්ගය හැටියට අනුමාන කළ හැකි මාර්ග දැක්වීමක් සඳහන් කොට ඇත. අෂ්ට ඵලරුහ දෙතිස් ඵලරුහ පිහිටි තැන් නිශ්චිත ලෙස එහි සඳහන් කිරීම අසීරුය.

නිබන්ධක

පුස්තකාලය
කැලණිය විශ්වවිද්‍යාලය (ශ්‍රී ලංකාව)
කැලණිය,